සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Department of Education, Southern Province**

81 | S | I

**පළමු වාර පරීක්ෂණය 2019 මාර්තු**
**First Term Test, March 2019**

**10 ශ්‍රේණිය**
Grade 10

**කෘෂි හා ආහාර තාක්ෂණය - I**

**පැය එකයි**
One hour

සැලකිය යුතුයි.

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට ගැලපෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

01. 'මින්නේරි දෙවියන්' ලෙස දේවත්වයෙන් පුදනලද කෘෂිකර්මාන්තයට අවශ්‍ය ජල සම්පාදනයට ඉහළ අනුග්‍රහයක් දැක්වූ රජතුමා වන්නේ,
    (1) පරාක්‍රමබාහු රජතුමා ය. (2) වසභ රජතුමා ය.
    (3) ධාතුසේන රජතුමා ය. (4) මහසෙන් රජතුමා ය.

02. අනුරාධපුර යුගයේ ඉදි කෙරුණු ප්‍රථම වැව වන්නේ,
    (1) තිසා වැව යි. (2) යෝධ වැව යි. (3) අභය වැව යි. (4) කලා වැව යි.

03. ශ්‍රී ලංකාවේ ප්‍රථම බහු කාර්ය සංවර්ධන ව්‍යාපෘතිය වනුයේ,
    (1) මහවැලි ව්‍යාපෘතිය යි. (2) ලුණුගම්වෙහෙර ව්‍යාපෘතිය යි.
    (3) ගල්ඔය ව්‍යාපෘතිය යි. (4) නිල්වලා ව්‍යාපෘතිය යි.

04. වර්ෂාපතනය මනින සම්මත ඒකකය වන්නේ,
    (1) මිලි ලීටර් ය. (2) මිලි මීටර් ය. (3) සෙන්ටි මීටර් ය. (4) අඟල් ය.

05. අවශ්‍ය අවස්ථාවලදී, අවශ්‍ය ප්‍රමාණවලින්, අවශ්‍ය ආහාර වර්ග ගුණාත්මක බවින් යුතුව ලබා ගැනීමට ඇති හැකියාව හඳුන්වනු ලබන්නේ,
    (1) ආහාර සංරක්ෂණය වශයෙනි. (2) ආහාර පරිරක්ෂණය වශයෙනි.
    (3) ආහාර සුරක්ෂිතතාවය වශයෙනි. (4) ආහාර සුලබතාවය වශයෙනි.

06. නිරිත දිග මෝසම් වැසි ලැබෙන කාල සීමාව වන්නේ,
    (1) මාර්තු - අප්‍රේල් දක්වා ය. (2) ඔක්තෝම්බර් - නොවැම්බර් දක්වා ය.
    (3) මැයි - සැප්තැම්බර් දක්වා ය. (4) දෙසැම්බර් - පෙබරවාරි දක්වා ය.

07. ආග්නේය, අවසාදිත හා විපරිත පාෂාණවලට උදාහරණ පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,
    (1) වැලිගල්, ක්වාට්ස්, නයිස් ය. (2) ක්වාට්ස්, හුණුගල්, නයිස් ය.
    (3) නයිස්, ග්‍රැනයිට්, හුණුගල් ය. (4) මිණිරන්, ඩොලමයිට්, ක්වාට්ස් ය.

08. පසෙහි කැටායන හුවමාරු ධාරිතාව ඉහළ නැංවීමට දායකවන පාංශු සංඝටක වනුයේ,
    (1) රොන්මඩ හා සියුම් වැලි ය. (2) මැටි හා රොන්මඩ ය.
    (3) මැටි හා හියුමස් ය. (4) රොන්මඩ හා හියුමස් ය.

09. පහත දී ඇති ලක්ෂණ වලට ගැළපෙන පස් වර්ගය දී ඇති වරන අතරින් තෝරා දක්වන්න.

- භාෂ්මික අයන සේදියාමෙන් පස ආම්ලික වී ඇත.
- තෙත් කලාපයේ බහුලව ව්‍යාප්ත වී ඇත.

(1) රතු දුඹුරු පස (2) දියළු පස

(3) රතු කහ පොඩ්සොලික් පස (4) රෙගෙසෝල් පස

10. පාංශු ජලය පිළිබඳව ප්‍රකාශ කිහිපයක් පහත දී ඇත.

A පාංශු මහා අවකාශ තුලින් පහලට ගලා යන්නේ ගුරුත්වාකර්ෂණ ජලයයි.

B ජලාකර්ෂණ ජලය ශාකවලට පහසුවෙන් අවශෝෂණය කල හැකිය.

C පාංශු ක්‍ෂුද්‍ර අවකාශ තුළ රැඳී පවතින්නේ කේශාකර්ෂණ ජලයයි.

මින් වඩාත් නිවැරදි වන්නේ,

(1) A පමණි. (2) A හා B පමණි. (3) B හා C පමණි. (4) A හා C පමණි.

11. වාර්ෂික වර්ෂාපතනය මිලි මීටර් 2750 සහ උච්චත්වය මීටර් 650 ක්ද වන ප්‍රදේශය අයත්වන කෘෂි දේශගුණික කලාපය වන්නේ,

(1) උඩරට තෙත් කලාපයයි. (2) මැදරට තෙත් කලාපයයි.

(3) මැදරට අතරමැදි කලාපයයි. (4) උඩරට අතරමැදි කලාපයයි.

12. පසක pH අගය මැන ගැනීම සඳහා ඔබට පාසලේ දී පහසුවෙන් කළ හැකි වන්නේ,

(1) pH කඩදාසි මගින් පරීක්‍ෂා කර බැලීමයි. (2) පසට හුණු යෙදීමයි.

(3) පසට කාබනික ද්‍රව්‍ය එකතු කිරීමයි. (4) පාංශු ප්‍රතික්‍රියා සිදු කිරීමයි.

13. මැටි අංශුවක විෂ්කම්භය මිලි මීටර්,

(1) 0.0002 ට වඩා අඩු ය. (2) 0.02 - 0.2 අතර ය.

(3) 0.002 වඩා අඩු ය. (4) 0.002 වඩා වැඩි ය.

14. පාංශු ජනනය යනුවෙන් අදහස් වන්නේ,

(1) පාෂාණවලින් මාතෘ ද්‍රව්‍ය ඇති වීමයි.

(2) පාෂාණ රසායනික ජීර්ණය වීමයි.

(3) මාතෘ ද්‍රව්‍යවලින් පස ඇති වීමයි.

(4) පාංශු ඛාදනයෙන් පාංශු අංශු වෙනත් ස්ථානයක තැම්පත් වීමයි.

15. භූමියේ උච්චත්වය ඉහළ යන විට,

(1) ආර්ද්‍රතාවය වෙනස් නොවේ. (2) ආර්ද්‍රතාවය ඉහළ යයි.

(3) ආලෝක තීව්‍රතාවය පහළ යයි. (4) උෂ්ණත්වය පහළ යයි.

16. දිවා කාලයේ දී වැඩි උෂ්ණත්වයක් හා රාත්‍රී කාලයේදී අඩු උෂ්ණත්වයක් තිබීම හිතකර වන්නේ කුමන බෝග වගාව සඳහා ද?

(1) වී වගාවේදී (2) බඩඉරිඟු වගාවේදී

(3) අල බෝග වගාවේදී (4) මිරිස් වගාවේදී

17. මන්සල් වර්ණ සටහන උපයෝගී කරගනු ලබන්නේ,

(1) පාංශු සංඝටක පිළිබඳව නිර්ණය කිරීමට. (2) පාංශු වයනය පිළිබඳව නිර්ණය කිරීමට.

(3) පාංශු ජලය පිළිබඳ නිර්ණය කිරීමට. (4) පාංශු වර්ණය පිළිබඳව නිර්ණය කිරීමට.

18. තේ, රබර්, පොල් යන බෝග පිළිබඳ පර්යේෂණායතන පිහිටා ඇත්තේ,

(1) බතලගොඩ, අගලවත්ත හා ලුණුවිල ය. (2) ලබුදූව, අම්බලන්තොට හා මහඉලුප්පල්ලම ය.

(3) තලවකැලේ, අගලවත්ත හා ලුණුවිල ය. (4) ගන්නෝරුව, බෝඹුවල හා තලවකැලේ ය.

19. ශ්‍රී ලංකාවේ කෘෂි දේශගුණික කලාප සංඛ්‍යාව,

(1) 5 කි. (2) 3 කි. (3) 7 කි. (4) 9 කි.

20. වර්ෂාපතනය, ආර්ද්‍රතාවය, උෂ්ණත්වය හා සුළඟේ වේගය යන කාලගුණික තොරතුරු ලබා ගැනීම සඳහා භාවිතා වන උපකරණ පිළිවෙලින් දක්වා ඇති පිළිතුර වන්නේ,

(1) වර්ෂාමානය, තෙත් හා වියළි බල්බ උෂ්ණත්වමානය, උෂ්ණත්වමානය, අනිලමානය.

(2) අනිලමානය, උෂ්ණත්වමානය, තෙත් හා වියළි බල්බ උෂ්ණත්වමානය, වර්ෂාමානය

(3) තෙත් හා වියළි බල්බ උෂ්ණත්වමානය, වර්ෂාමානය, උෂ්ණත්වමානය, අනිලමානය.

(4) වර්ෂාමානය, සූර්යදීප්තමානය, උෂ්ණත්වමානය, තෙත් හා වියළි බල්බ උෂ්ණත්වමානය.

21. කාබනික ද්‍රව්‍ය දිරාපත් වී හියුමස් බවට පත් වේ. පසක හියුමස් වැඩිපුර අඩංගු වීමෙන් එම පසේ,

(1) කැටායන හුවමාරු ධාරිතාවය අඩු වේ. (2) ජලය රඳවා ගැනීමේ හැකියාව අඩු වේ.

(3) ජීව ක්‍රියාකාරීත්වය වැඩි වේ. (4) පාංශු ඛාදනය වැඩි වේ.

22. පස හා සම්බන්ධ ප්‍රකාශ තුනක් පහත දැක්වේ.

A මැටි හා හියුමස්, කලිල ලෙස පසේ අඩංගු වේ.

B මැටි පසේ පාංශු වාතය වැඩිය.

C කැටායන හුවමාරු ධාරිතාවය පස් 100 g ට මිලි සමක වලින් මනිනු ලැබේ.

මින් නිවැරදි වන්නේ,

(1) A හා B ය. (2) A හා C ය. (3) A, B හා C ය. (4) B හා C ය.

23. 'රටක ශ්‍රම බලකාය ඵලදායි ආර්ථික කටයුතුවල නියැලීම' කුමන නමින් හඳුන්වයිද?

(1) සේවා වියුක්තිය (2) නිෂ්පාදන ධාරිතාවය

(3) ආහාර සුරක්ෂිතතාවය (4) සේවා නියුක්තිය

24. 2019 වර්ෂයේ ආරම්භයේ දී ශ්‍රී ලංකාවේ බෝග වගාවට තර්ජනයක් වූ පළිබෝධකයාගේ කීටයා වන්නේ,

(1) ඩයමන් බ්ලැක්මොත් ය. (2) සේනා දළඹුවා ය.

(3) සිට්‍රස් දළඹුවා ය. (4) පුරුක් පණු කීටයා ය.

25. වැවක ඇති අතිරික්ත ජලය පිටකිරීම සිදු කරනුයේ,

(1) සොරොව්ව මගිනි. (2) රළපනාව මගිනි.

(3) පිටවාන මගිනි. (4) බිසෝකොටුව මගිනි.

26. සුළං දිශා දර්ශකය ඊතලයේ පිහිටීම රූපසටහනේ දැක්වේ.

මේ අනුව සුළං හමන දිශාව වන්නේ,




(1) බටහිර සිට නැගෙනහිරට ය. (2) නිරිත සිට ඊසානට ය.

(3) උතුරේ සිට දකුණට ය. (4) ඊසාන සිට නිරිතට ය.

27. සෙවණ ප්‍රියකරන ශාකයක් වන්නේ,

(1) වී ය. (2) බඩඉරිඟු ය. (3) ඇන්තූරියම් ය. (4) උක් ය.

28. ශ්‍රී ලංකාවේ දිගම දිවා කාලය ඇති මාසය වන්නේ,

(1) දෙසැම්බර් ය. (2) අගෝස්තු ය. (3) මාර්තු ය. (4) ජුනි ය.

29. සිසුන් පිරිසක් ප්ලාස්ටික් බෝතලයක් යොදාගෙන වර්ෂාමානයක් සකස් කර පාසල් වත්තේ ස්ථානගත කරන ලද අතර එහි දෝෂයක් ඇති බව ගුරුතුමා විසින් පෙන්වා දෙන ලදී. එම දෝෂය විය හැක්කේ,

(1) සමතලා බිමක පිහිටුවා තිබීම.

(2) එළිමහන් ස්ථානයක පිහිටුවා තිබීම.

(3) ආසන්නම ගොඩනැගිල්ලේ උසට සමාන දුරකින් පිහිටුවා තිබීම.

(4) සුළඟට නොපෙරෙලෙන ලෙස සවිකර තිබීම.

30. වායුගෝලයේ සංයුතිය හා සැසඳීමේදී පාංශු වාතයේ වැඩිපුර අඩංගු වී ඇත්තේ,
(1) ඔක්සිජන් ය. (2) කාබන්ඩයොක්සයිඩ් ය.
(3) නයිට්‍රජන් ය. (4) මීතේන් ය.

31. සමහර ශාකවල පුෂ්පීකරණය සඳහා දිවා කාලයේ දිග බලපායි. දිවා කාලයේ දිගට ශාක දක්වන ප්‍රතිචාරය හඳුන්වන්නේ,
(1) ප්‍රභා අවධි සංවේදිතාවය වශයෙනි. (2) උත්ස්වේදනය වශයෙනි.
(3) ප්‍රභා අවධි අසංවේදිතාව වශයෙනි. (4) සාපේක්ෂ ආර්ද්‍රතාව වශයෙනි.

32. පාංශු වාතය සම්බන්ධ වැරදි ප්‍රකාශය තෝරන්න.
(1) පාංශු වාතය පාංශු ජීවීන්ගේ ශ්වසනයට උපකාරී වේ.
(2) පාංශු වාතය ශාක මුල්වල ශ්වසනයට අවශ්‍ය වාතය ලබා දේ.
(3) පාංශු ඛාදනය වැළැක්වීමට පාංශු වාතය උපකාරී වේ.
(4) පාංශු ජීර්ණයට අවශ්‍ය කාබනික අම්ල සෑදීමට ආධාර වේ.

33. වායුගෝලීය සාපේක්ෂ ආර්ද්‍රතාව බෝග වගා කටයුතු කෙරෙහි බලපාන සාධකයකි. වායුගෝලීය සාපේක්ෂ ආර්ද්‍රතාව වැඩි වූ විටදී,
(1) ශාකවල උත්ස්වේදන ශීඝ්‍රතාවය වැඩි වේ. (2) ශාක රෝග හා පළිබෝධ හානි වැඩි වේ.
(3) ධාන්‍ය අස්වනුවල ගබඩා කාලය වැඩි වේ. (4) ශාක මුල්වල ජල අවශෝෂණය වැඩි වේ.

34. පසෙහි pH අගය පරීක්ෂා කළ විට එහි අගය 5.2 ක් විය. මෙම පස,
(1) ක්ෂාරීය පසකි. (2) ප්‍රබල ක්ෂාරීය පසකි.
(3) ආම්ලික පසකි. (4) ප්‍රබල ආම්ලික පසකි.

35. යුරෝපීය ආක්‍රමණ නිසා මෙරට යැපුම් කෘෂිකර්මාන්තය වාණිජ කෘෂිකර්මාන්තය බවට පත් විය. මෙසේ වාණිජකරණය නිසා ප්‍රධාන වගා බවට පත් වූයේ,
(1) වී, මිරිස්, බඩඉරිඟු හා සෝගම් ය. (2) ගම්මිරිස්, කුරුඳු, එන්සාල් හා තේ ය.
(3) තේ, පොල්, රබර් හා කුරුඳු ය. (4) විසිතුරු මල්, පුවක්, පළතුරු හා ගම්මිරිස් ය.

36. පස හා කාබනික ද්‍රව්‍ය ආහාරයට ගනිමින් පසේ භෞතික ලක්ෂණ දියුණු කිරීමට වැදගත් වන ජීවියෙකු වන්නේ,
(1) වේයන් ය. (2) කුහුඹුවන් ය. (3) කම්බිලි පණුවන් ය. (4) ගැඩවිලුන් ය.

37. ශිෂ්‍යයෙක් පස් සාම්පල් තුනක් ගෙන එයට ජලය දමා ගුලිකර පසුව රෝල් කර මුද්දක් ආකාරයට සකසන ලදී. මෙම පස් සාම්පල් තුන අතරින් ඉතාම සාර්ථකව මුද්දක් ආකාරයට සැකසීමට හැකි වූ පස් වර්ගය වන්නේ,
(1) වැලි පසයි. (2) මැටි පසයි. (3) මැටි ලෝම පසයි. (4) වැලි ලෝම පසයි.

38. පාංශු හායනය කෙරෙහි බලපාන සාධකයක් නොවන්නේ,
(1) පසෙහි තද ස්තර ඇති වීම. (2) පාංශු ඛාදනය.
(3) පසට කාබනික පොහොර යෙදීම. (4) පස ආම්ලික වීම හෝ ක්ෂාරීය වීම.

39. ශ්‍රී ලංකාවේ බහුලවම දැකිය හැකි විපරිත පාෂාණය වන්නේ,
(1) නයිස් ය. (2) ඩොලමයිට් ය. (3) කිරිගරුඬ ය. (4) ග්‍රැනයිට් ය.

40. පාංශු සංරක්ෂණ ක්‍රමයක් ලෙස බහුලව භාවිතා කරන දෙ වැටි ක්‍රමයට ඉතාම සුදුසු ශාක වන්නේ,
(1) කොහොඹ හා කොස් ය. (2) පේර හා දෙළුම් ය.
(3) සූරියකාන්ත හා ගම්සූරියයි. (4) ග්ලිරිසිඩියා හා ඉපිල් ඉපිල් ය.

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

81 | S | II

පළමු වාර පරීක්ෂණය 2019 මාර්තු
First Term Test, March 2019

10 ශ්‍රේණිය
Grade 10

# කෘෂි හා ආහාර තාක්ෂණය - II

පැය දෙකයි
Two hours

- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.

(01) සාර්ථක බෝග වගාවන් සඳහා පස වැදගත් සාධකයක් වේ. පස නිර්මාණය වන්නේ පාෂාණ ජීර්ණය හා පාංශු ජනනයේ ප්‍රතිඵලයක් වශයෙනි.

(i) පාෂාණ ජීර්ණයට හේතුවන භෞතික සාධක දෙකක් නම් කරන්න.

(ii) පහත සටහන සම්පූර්ණ කරන්න.




(iii) කෘෂිකාර්මික කටයුතුවලදී පාංශු වයනය පිළිබඳ දැනුවත්වීමේ ඇති වැදගත්කම් දෙකක් ලියන්න.

(iv) පසක දැකිය හැකි කාබනික ද්‍රව්‍ය වියෝජනයට දායක වන ක්ෂුද්‍ර ජීවී කාණ්ඩ දෙකක් නම් කරන්න.

(v) ශාක වර්ධනයට පසෙන් ලබා ගන්නා ද්‍රව්‍ය දෙකක් ලියන්න.

(vi) වැලි අධික පසක් බෝග වගාවට නුසුදුසු වීමට හේතු දෙකක් ලියන්න.

(vii) වැලි අධික පසක් බෝග වගාවට සුදුසු පරිදි සැකසීමට එකතු කලයුතු ද්‍රව්‍ය දෙකක් ලියන්න.

(viii) පසේ ඇති ඛනිජ නොවන සංඝටක දෙකක් ලියන්න.

(ix) බෝග වගාවට පාංශු වාතයේ ඇති වැදගත්කම් දෙකක් ලියන්න.

(x) ක්ෂාරීයතාවය නිසා බෝග වගාවට නුසුදුසු වූ පසක් බෝග වගාවට සුදුසු තත්ත්වයට පත් කිරීමට යෙදිය යුතු ද්‍රව්‍ය දෙකක් ලියන්න.

(02) වර්ෂාපතනය ශ්‍රී ලංකාවේ දේශගුණය කෙරෙහි බලපාන ප්‍රධාන සාධකය වේ.

(i) (a) ශ්‍රී ලංකාවට වර්ෂාව ලැබෙන ප්‍රධාන ක්‍රම මොනවාද?

(b) වර්ෂාපතනය ලැබීම අනුව ශ්‍රී ලංකාව බෙදා තිබෙන ප්‍රධාන දේශගුණික කලාප තුන නම් කරන්න.

(ii) (a) ශ්‍රී ලංකාවට ලැබෙන වර්ෂාපතනය අනුව වගා කටයුතු සිදුකරන ප්‍රධාන වගා කන්න දෙක කවරේද?

(b) වර්ෂාපතනය මැනීම සඳහා භාවිතා කරන උපකරණය කුමක්ද?

(iii) බෝග වගාවේදී වර්ෂාපතනයේ හිතකර බලපෑම් හතරක් ලියන්න.

(03) බෝග වගාවේදී කාලගුණික පරාමිති පිළිබඳව දැනුවත් වීම ඉතා වැදගත් වේ.




(i) (a) රූප සටහනේ දැක්වෙන උපකරණය භාවිත කරනු ලබන්නේ කුමන කාලගුණික පරාමිතිය මැනීම සඳහා ද?

(b) මෙම උපකරණයේ A හා B කොටස් නම් කරන්න.

(ii) (a) ආලෝක තීව්‍රතාවය බෝග වගාවේදී ඇතිකරනු ලබන හිතකර බලපෑම් තුනක් සඳහන් කරන්න.

(b) ආලෝක තීව්‍රතාවය මැනීම සඳහා භාවිතා වන උපකරණ කුමක්ද?

(iii) වැඩි සාපේක්ෂ ආර්ද්‍රතාවය බෝග වගාවට ඇතිකරනු ලබන අහිතකර බලපෑම් හතරක් ලියන්න.

(04) අතීතයේ සිට වර්තමානය දක්වාම ශ්‍රී ලංකාව කෘෂි කාර්මික රටක් ලෙස ප්‍රචලිතය.

(i) ශ්‍රී ලංකාවේ අතීතයේ සිට කෘෂිකර්මාන්තය පැවති බවට ඇති සාක්ෂි තුනක් ලියන්න.

(ii) (a) වැව් බැඳි රාජ්‍ය ලෙස හඳුන්වන්නේ ශ්‍රී ලංකාවේ කුමන ප්‍රදේශයද?

(b) වැවක දැකිය හැකි කොටස් තුනක් නම් කර ඉන් කෙරෙන කාර්යය බැගින් ලියන්න.

(iii) ශ්‍රී ලංකාවේ කෘෂි කර්මාන්තය සඳහා ඇති විභවයන් තුනක් නම් කරන්න.

(05) මනා පාංශු ව්‍යුහයක් සහිත පසක ප්‍රශස්ථ මට්ටමින් ජලය හා වාතය රඳවා ගනියි.

(i) (a) පාංශු ව්‍යුහය යනුවෙන් අදහස් වන්නේ කුමක්ද?

(b) පාංශු ව්‍යුහය පවතින ප්‍රධාන ආකාර කවරේද?

(ii) (a) පාංශු ජලය පවතින ආකාර මොනවාද?

(b) මිත් ශාකවලට ලබාගත හැකි ජල වර්ගය කුමක්ද?

(iii) (a) පසක් ආම්ලික වීමට බලපාන හේතු දෙකක් ලියන්න.

(b) ආම්ලිකතාවය උදාසීන කිරීමට පසට යෙදිය හැකි ද්‍රව්‍ය දෙකක් සඳහන් කරන්න.

(06) බෝග වගාවේදී ප්‍රධාන උපස්ථරය හෙවත් වගා මාධ්‍ය ලෙස පස ඉතා වැදගත් වේ.

(i) (a) බෝග වගාවට පසෙන් ඉටුකරන ප්‍රධාන කාර්යයන් දෙකක් ලියන්න.

(b) ශ්‍රී ලංකාවේ වියලි කලාපීය ප්‍රදේශවල බහුලවම දැකිය හැකි පස් වර්ගය නම් කරන්න.

(ii) (a) පසෙහි අඩංගු විවිධ විශාලත්වයෙන් යුත් පාංශු ඛනිජ අංශුවල සාපේක්ෂ ව්‍යාප්තිය අනුව තීරණය කෙරෙන පාංශු ලක්ෂණය කුමක්ද?

(b) පසෙහි සිටින ජීවීන්ගෙන් සිදුවන කාර්යයන් දෙකක් ලියන්න.

(iii) පසෙහි කාබනික ද්‍රව්‍ය අඩංගු වීමේ ඇති වැදගත්කම තුනක් සඳහන් කරන්න.

(07) අවධිමත් කෘෂිකාර්මික කටයුතු ඇතුළු මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් පසේ නිෂ්පාදකතාව හීන වීම පාංශු හායනය ලෙස හැඳින්වේ.

(i) පාංශු හායනයට හේතුවන කරුණු තුනක් ලියන්න.

(ii) බෝග වගාවට නුසුදුසු තත්වයට පත් වූ (හායනයට පත් වූ) පසක් බෝග වගාවට සුදුසු තත්ත්වයට පත් කර ගැනීමට ගතහැකි ක්‍රියාමාර්ග තුනක් ලියන්න.

(iii) (a) පාංශු ඛාදනය යනු කුමක්දැයි අර්ථ දක්වන්න.

(b) පාංශු සංරක්ෂණය සඳහා යොද ගත හැකි ක්‍රම තුනක් ලියන්න.